පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - චිත්‍ර

ශ්‍රේණිය - 8

සතිය- 6

Prepared by- ඩී.එච්.ඩබ්.පී.කපුගෙදර මයා(ISA)

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

**5.3.1. එකලස් කිරීමේ ශිල්ප ක්‍රමයට අනුව මූර්තියක් නිර්මාණය කරමු.**

දුවේ ,පුතේ,

ඔන්න අද අපි සූදානම් වෙන්නේ ඉවත ලන සැහැල්ලු ද්‍රව්‍ය කිහිපයක් එකිනෙක සම්බන්ධ කරමින් අපූරු නිර්මාණයක් කරන්නයි.

මේ සඳහා පහත සඳහන් ද්‍රව්‍ය සපයා ගැනීමට උත්සාහ දරන්න.

- සැහැල්ලු ඒකක වර්ග
  I. විවිධ වර්ගයේ ප්ලාස්ටික් බෝතල් ,මූඩි, ටොනික් පියන්,දත්තාලේප නොමැති ටියුබ්,පෑන් බට හා ක්ලිප් වර්ග /ප්ලාස්ටික් ඇසුරුම් පෙට්ටි/PVC බට වැනි දෑ.රබර් හෝ ප්ලාස්ටික් බෝල
  II.පොලිතීන් වලින් කරන ලද ඝනකම ඇසුරුම් කවර වැනි දෑ.
  III.වියලි ශාක පත්‍ර/පොතු/ඇට වැනි දෑ
- සාමාන්‍ය බරැති ඒකක වර්ග
  I. වියලි ශාක කොටස් ( රීප්ප,ලෑලි,අරටු කොටස්,වෙනත් )
  II.විවිධ ලෝහමය තහඩු වර්ග,ටින් වර්ග,බයිසිකල් බෝල,
- බරින් වැඩි ඒකක වර්ග
  ලෝහමය පට්ටම් වර්ග /විවිධ යාන්ත්‍රික කොටස්/ගැල්වර්නයිස් බට වර්ග
  (මේ සියල්ල පාවිච්චියෙන් ඉවතලන දේවල් නිසා මුදල් වැය වීමක් සිදු නොවේ)

  ඉහත කී අමුද්‍රව්‍ය වලින් තෝරා ගත් කොටස් එකිනෙකට සම්බන්ධ කිරීමට අවශ්‍ය වන ඇලවුම් කාරක /බන්ධන කාරක පහත සඳහන් පරිදි සපයා ගැනීමට/භාවිතා කිරීමට සැළකිලිමත් වන්න.

I. කඩදාසි/කාඩ් බෝඩ් ඇලවීම සඳහා බයින්ඩර් ගම්

II. ප්ලාස්ටික් වර්ග ඇලවීම සඳහා (ජලයේ දිය නොවන)

- මල්ටි බොන්ඩ් -374 වැනි ගම් වර්ග
- සුපර් ග්ලූ වර්ග ( මෙවා ඇඩි අවදානම් බැවින් වැඩිහිටියන්ගේ සහයෝගය ලබා ගනිමින් සිදු කිරීම වැදගත් වේ)

III. නූල් වර්ග හෝ සිහින් කම්බි වර්ග භාවිතයෙන් බැඳ තැබීම හො මසා ගැනීමට හැක.

IV. වෙලුම් පටි වර්ග ( රෙදි හෝ රබර් පටි )භාවිතයෙන් වෙලීමට හැක.

V. යකඩ හෝ වෙනත් ලෝහමය කොටස් සම්බන්ධ කිරීමට වෙල්ඩින් කිරීම,රිවට් ගසා ගැනීම ,බෝල්ට් ඇණ දැමීම සිදු කළ හැක. (මේ සඳහා කාර්මික ශිල්පීන්ගේ සහය ලබා ගන්න.)

VI. දැවමය කොටස් සම්බන්ධ කිරීමට විවිධ ඇණ වර්ග EPI FIX ,CHEMIFIX වැනි ගම් වර්ග භාවිත කළ හැක.

VII.ප්ලාස්ටික් වර්ග රත් කිරීමෙන් ඇලවීමටත් පුළුවනි ( ප්ලාස්ටික් වර්ග දැවීමෙන් පිටවන දුමාරය පිළිකා කාරකයක් බැවින් ඒ පිළිබඳ සැලකිලිමත්වන්න.වැඩිහිටි සහය ලබා ගන්න )

ඉහත කී අමුද්‍රව්‍ය  වලින් ඔබට පහසුවෙන් සපයා ගත හැකි ද්‍රව්‍ය එකක් හෝ කිහිපයක් භාවිතා කරන්න.ඊට සුදුසු බන්ධන මාධ්‍ය භාවිතා කරන්න.

ඔබ භාවිතයට ගන්නා අමුද්‍රව්‍ය වල ස්වභාවය අනුව  පහත සඳහන් උපකරණ භාවිතා කිරීමට සිදුවේවි.

( පේපර් කටර්,කියත් වර්ග,කතුරු වර්ග,විදින උපකරණ,අඬු මිටි,උල් අඬු ,කටර් අඬු, විවිධ පිහි වර්ග,බෝල්ට් ඇණ

තද කිරීමට යතුරු වර්ග,වැලි කඩදාසි )

( ඉහත උපකරණ, අමු ද්‍රව්‍ය භාවිතා කිරීමේදී වැඩිහිටි සහයෝගය අනිවාරයෙන් ලබා ගන්න )

මෙම ක්‍රියාකාරකම තවදුරටත්  සාර්ථක කර ගැනීමට අන්තර්ජාලය හා **YouYube** සෙවුම් උපකරණ භාවිතා කරමින් **assemblage sculpture** ලෙස ටයිප් කර සොයා බලන්න.

පවතින වසංගත තත්ත්වය යටතේ ඉතා සුපරික්ෂාකාරීව කටයුතු කරමින් අමුද්‍රව්‍ය සපයා ගැනීම සිදු කරන්න.වැඩිහිටි හා වෘත්තීය ශිල්පීන්ගේ සහය ලබා ගන්න.ඉවත ලන දෑ භාවිතයේදී  එම අමුද්‍රව්‍ය සුදුසු පිරිසිදු කිරීම් ද්‍රව්‍ය භාවිත කරමින් පිරිසිදු කරගන්න.සියල්ලට ප්‍රථමයෙන් තමාගේ හා අන් අයගේ අරක්ෂාව සලසා ගත යුතු බවට තරයේ මතක තබා ගන්න.

සිදුකරන ලද නිර්මාණය පාසල් ආරම්භ වීමෙන් පසු  විෂයභාර ගුරුභවතා වෙත ඉදිරිපත් කරන්න.තම නිර්මාණය චිත්‍ර කාමරයේ හෝ පන්ති කාමරයේ ප්‍රදර්ශනයට තබන්න.

නිදර්ශන නිර්මාණ කිහිපයක්






